# පරිසරය

## 5 ශ්‍රේණිය



Start Your Learning Journey with e-thaksalawa

The National e-learning Portal for The General Education

# 11. ගමනාගමනය

## ක්‍රියාකාරකම 1

- ඔබ මහා මාර්ගයේ ගමන් කරන විට මාර්ග සංඥා දැක ඇත. එම ස්ථාන සිහිපත් කරමින් චිත්‍රයට නගන්න. තමන් කැමති ස්ථාන 2ක්

  උදා:

  - ළමයින් මාරුවන ස්ථානය (පාසල අසල)
  - රථවාහන ආලෝක සංඥා ඉදිරියෙනි

## ක්‍රියාකාරකම 2

- මහා මාර්ගයේ දැක ඇති ආලෝක සංඥා පද්ධතියක ආකෘතියක් පරිසරයෙන් සපයා ගත හැකි ද්‍රව්‍ය උපයෝගී කරගෙන නිර්මාණය කරන්න.

  - ලෑලි කැබැල්ලක්, වියලි කෝෂයක්, කුඩා බල්බ 3ක්, වයර් කැබලි කිහිපයක්, ඇමුණුම් කටුවක් හා ඩ්‍රෝවින් පින්, බල්බ 3 පාට කිරීමට අවශ්‍ය පාට හෝ රතු, කොළ සහ කහ සෙලෝපේන් කඩදාසි

  - වැඩිහිටියෙකුගේ උදව් ඇතිව මෙය සාදාගෙන සෙල්ලම් මාර්ග සංඥා පද්ධතියේ ක්‍රියාකාරීත්වය අත් විඳින්න.

## ක්‍රියාකාරකම 3

- ශ්‍රී ලංකාවේ මාර්ග සිතියමක් සපයා ගන්න. එහි විවිධ මාර්ග හඳුනාගැනීමට යොදා ඇති සංකේත සොයා බලන්න. මාර්ග සංඥා සඳහා යොදා ඇති වර්ණ හඳුනාගන්න.

  උදා: අධිවේගී මාර්ගය E01 දම්පාට ලෙස


Copyright© www.e-thaksalawa.moe.gov.lk

## ක්‍රියාකාරකම 4

- ඉහත මාර්ග සිතියම නිරීක්ෂණය කරමින් ප්‍රධාන නගර කිහිපයකට ළඟා විය හැකි ප්‍රධාන මහා මාර්ග හා දුම්රිය මාර්ග හඳුනාගන්න.

  උදා: <u>මහාමාර්ග</u>

  - කොළඹ – මහනුවර
  - කොළඹ – මාතර

  <u>දුම්රිය මාර්ග</u>

  - කොළඹ – බදුල්ල
  - කොළඹ – අවිස්සාවේල්ල

## ක්‍රියාකාරකම 5

- ශ්‍රී ලංකාවේ සිතියමක් හොඳින් නිරීක්ෂණය කර එහි දක්වා ඇති ගුවන් තොටුපළවල් හා වරායවල් හඳුනාගන්න. ඒවා තිබෙන ස්ථාන ශ්‍රී ලංකා සිතියමක ලකුණු කරන්න.

## ක්‍රියාකාරකම 6

- අතීතයේ හා වර්තමානයේ භාවිතා වන ප්‍රවාහන ක්‍රම පිළිබඳව තොරතුරු සොයා බලන්න. ඒ සඳහා ලියා ඇති කතන්දර පොත් සොයා කියවන්න. කතන්දර වැඩිහිටියන්ගෙන් අසා දැන ගන්න.

  උදා: රාවණා රජු දඬුමොනරයෙන් ගමන් කළ කතාව.

## ක්‍රියාකාරකම 7

- නිවසේ සිටින අය සමඟ කෝච්චියෙන් කොළඹ යමු ක්‍රීඩාව කරන්න.
  - රතු, කහ, කොළ සංඥා පුවරු
  - දුම්රිය ස්ථානයකදී පණිවිඩ හුවමාරු සඳහා දෙන වළල්ල (ටැබ්ලට් එක)
  - විසිල් එක
  - ඉහත ද්‍රව්‍ය පරිසරයෙන් ලබා ගත හැකි දේවල් වලින් සකස් කර ගෙන දුම්රිය ස්ථානයක සිදු කරන දේවල් වැඩිහිටියෙකුගෙන් අසාගෙන ක්‍රීඩාව කරන්න.

අන්තර්ගතය: වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
සැකසුම: ජී.කේ් සත්‍ය ධනංජය ජයරත්න—හ/ වීරකැටිය රාජපක්ෂ මධ්‍ය විද්‍යාලය—වීරකැටිය
Copyright© www.e-thaksalawa.moe.gov.lk